මාධ්‍ය නිවේදන අංක 15

**මැතිවරණ කොමිෂන් සභාව**

**2021.05.18 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන නිවේදනය නිකුත් කිරීමට තීරණ ගෙන ඇත.**

පසුගිය දිනෙක කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පළාත් පාලන ආයතනයක රැස්වීමක දී සභිකයන් අතර අශෝභන හැසිරීමක් මෙන්ම පහරදීම් ද මාධ්‍ය මඟින් දැක ගැනීමට ලැබිණි. එම ආයතනයේ පමණක් නොව වෙනත් පළාත් පාලන ආයතනවල සහා රැස්වීම්වල දී ද මේ ආකාරයේ සිදුවීම් වරින් වර වාර්තා වූ අතර, පාර්ලිමේන්තුවේ දී ද මන්ත්‍රීවරුන්ගේ මෙවැනි හැසිරීම් රටා මඟින් ජනතාවට පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳ විශ්වාසය පළුදු කිරීමට හේතුවන තත්ත්වයක් සමාජය තුළ ගොඩනැගෙමින් පවතී. පාර්ලිමේන්තුව තුළ ක්‍රියාකාරකම් සම්බන්ධව කථානායකතුමාට පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පවතී. එහෙත් පළාත් පාලන ආයතනවල මෙවැනි හැසිරීම් සම්බන්ධව පොලිසිය මඟින් කරනු ලබන අපරාධමය වරදක් සඳහා වන ක්‍රියාමාර්ග හැර වෙනත් ක්‍රියාමාර්ග ගනු ලබන බවක් පෙනෙන්නට නොමැත.ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් කෙරෙහි මහජන විශ්වාසය බිඳ හෙළීමට හේතු වනුලබන මෙවැනි ක්‍රියා මහජනතාව තම අභිලාෂ, අපේක්ෂා සාක්ෂාත් කිරීමට පත් කරනු ලබන මහජන නියෝජිතයන්, ජනතාව විසින් ලබාදෙනු ලැබූ බලය අවභාවිතා කිරීමක් හා ජනතා විශ්වාසය බිඳ හෙළීමක් ලෙසට ද සලකනු ලැබිය හැකිය. එසේම බොහෝ පළාත් පාලන ආයතනවල කාන්තා සභිකයන් සම්බන්ධව දක්වන ආකල්පය හා හැසිරීම් ද ප්‍රාථමික මට්ටමේ පවතින බව ද කොමිෂන් සභාවේ නිරීක්ෂණය වී ඇත. මෙවැනි හැසිරීම් සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින්ම ගත හැකි ක්‍රියාමාර්ගයක් නොමැති අතර, නිදහස්, සාධාරණ හා රහස්‍ය ඡන්දය මඟින් පත් කරනු ලැබූ මහජන නියෝජිතයන්ගේ මෙම අනිසි ක්‍රියාකාරිත්වය පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව බලවත් කනස්සල්ල පළකර සිටී. යහපත් නියෝජන පාලන ක්‍රමයකට මෙය අභියෝගයක් ලෙස සලකන මැතිවරණ කොමිෂන් සභාව මෙම සභිකයන් පිළිබඳව උපරිම විනය ක්‍රියාමාර්ගය ගන්නා ලෙස එම සභිකයන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරනු ලබන්නේ නම් එම දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටිනු ලබන අතර, ඡන්දය ප්‍රකාශ කිරීමේ දී මෙම තත්ත්වයන් මනාව අවධානයට ගන්නා ලෙස මහජනතාවගෙන් කොමිෂන් සභාව ඉල්ලා සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.05.18